# <u>ධීවර ත්‍යාග අරමුදල</u>

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

2011 දෙසැම්බර් 31 දිනට ධීවර ත්‍යාග අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ කිසිදු මෙහෙයුම් ප්‍රතිඵලයක් දක්වා නොතිබූ අතර, ඉකුත් වර්ෂයේ අතිරික්තය වූ රු.525,010 ක් ඉදිරියට ගෙනවිත් තිබුණි.

#### 1.2.2 මෙහෙයුම් කටයුතු

1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ වූ විධිවිධාන යටතේ ධීවරයන් විසින් මුහුදේදී කරනු ලබන වැරදි සම්බන්ධයෙන් අධිකරණයක නඩු පැවරීමටත් ,එම තහනම් භාණ්ඩ රාජසන්තක කලවිට එම භාණ්ඩ ඇතුළු උපකරණ වෙන්දේසි කිරීමෙන් ලද මුදල ත්‍යාග අරමුදලට බැර කිරීමටත් එම මුදලින් වැටලීම් කටයුතුවලට සහභාගී වූ තැනැත්තෙකුට ත්‍යාගයක් වශයෙන් ධීවර අරමුදලින් ගෙවිය හැකි උපරිම මුදල් ප්‍රමාණය රු. 5000 ක් විය යුතු බවට ප්‍රතිපාදන සලසා තිබුණි. එසේ වුවද 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත හා බලාත්මක වන නියෝග උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් විවිධ චෝදනා යටතේ සමාලෝචිත වර්ෂයේ පවරන ලද නඩු සංඛ්‍යාව 187 කි. සමාලෝචිත වර්ෂය තුලදී නඩු අවසන් වී වෙන්දේසි කටයුතු සිදු කර නොතිබීම හේතුවෙන් ධීවර ත්‍යාග අරමුදලට අරමුදල් ලැබී නොතිබුණි.